# UNIQUE PARQUET

*Professionals in Wooden Flooring*

163/1 A,
Malwathuhiripitiya, Buthpitiya,
Gampaha

Tel : **077 393 55 34**
077 570 21 49
033 22 78 220

Reg. No. WR 9527

E-mail : pgampaha@yahoo.com
Web : www.upflorings.com


## වෘත්තීය විකාශනය

ගෙබිම ලී ඇතිරීම ඔප දැමීම වසර 1948 ට පෙර පාලන සමයේ පළමුව ලංකාවට හඳුන්වා දෙනු ලබයි. එවකට ලී ඇතිරූ ගෙබිමක් තිබුණා නම් කොළඹ, නුවර එළිය, හැටන්, නුවර යන ප්‍රදේශයන් හි ඉදිවී තිබූ විදේශ සමාගම් සතු ගොඩනැගිලි වල පමණි. කාලය ගතවෙත් ම සිලෝන් සුවිස් පාකි නමින් ආයතනයක් ලංකාව තුළ බිහි විය. මුල් කාලයේ විදේශීය පුහුණු කරුවන් විසින් මෙම ආයතනය තුළ ශ්‍රී ලාංකික සේවකයන් සුළු ප්‍රමාණයක් වෘත්තිය නිපුණතාවය ලැබීය. අනතුරුව ඉතා දියුණු තත්වයට පැමිණි මෙම ආයතනය ලංකාව පුරා විශාල වැඩබිම් ප්‍රමාණයක් ලී අතුරා ඔප දමා නිමකරන ලදී. එවකට කරන ලද එම වැඩ ප්‍රමාණයන් අදටත් දැකිය හැක. එයට හේතුව නම් ඉහල ප්‍රමිතිකරණය සම්මත ක්‍රමවේදයන් හා මූලධර්ම වලට ඇතුලත්ව ආරම්භයේ සිට අවසානය දක්වා පිළිවෙලට ඒ ඒ ක්‍රමවේදයන් අනුගමනය කිරීමයි. සිලෝන් සුවිස් පාකේ ආයතනය ගෙබිම ලී ඇතිරීම සම්බන්ධව ලංකාවේ මව් ආයතනයයි.

වර්තමානයේ මෙම වෘත්තිය බොහෝ වඩු කාර්මිකයන් අතින්ද නිමවනු ඇත. සුළු පරිමාණයේ හා මහ පරිමාණයේ ආයතන ද බිහිවී ඇත. මවු ආයතනයේ පය නොතැබූ වෘත්තිය මූලධර්ම නොහඳුනන වෘත්තිකයන් ද බිහි වී ඇත. ලංකාව තුළ දැව භාණ්ඩ ඔප දැමීමේ ආලේප ගෙන්වන ආයතන ද මෙම වෘත්තියට අවතීරණ වී ඇත. ලී මෝල් හිමියන් ද එක් වී ඇත.

බොහෝ විට මොවුන් හටද මෙම වෘත්තියේ නියැලීමට පුළුවන. එයට හේතුව නම් මෙම වෘත්තියේ පියවරෙන් පියවරට විනිවිද භාවයක් ඇති නිසාය. ගණිතය, විද්‍යාව සංකලනයෙන් බිහි වූ ස්වයං නිර්මාණ හැකියාව, ඒ ඒ ස්ථානයන් අනුව උචිත හැඩතල හඳුනාගැනීම, සමචතුරස්‍රාකාර, ඍජුකෝණාස්‍ර, ත්‍රිකෝණාකාර හැඩයකින් තොරව පිහිටි ස්ථානයක දී පරස් නොපෙනෙන අන්දමට ලී ඇතිරීම සිදුකරන ලබන වෘත්තිකයා මව් ආයතනයේ ආභාෂය ලැබුව වෘත්තිකයෙක් කිව හැක. ලී පොළොව මට්ටම් කිරීම, (ලෙවල්) හිදැස් පොටි කර සුමට කිරීම ගෙබිම සඳහා අනුමත ආලේප කිරීම ද විනිවිද දැකිය හැක.

එහෙත් ලී පොළොව සවිකිරීමේ දී ඇණ වර්ග භාවිතය, පාවිච්චි කරන ලද ගම් ප්‍රමාණය හඳුනා ගැනීම, ලී වල තෙතමනය යන කරුණු ද ලී පොළොව මට්ටම් කිරීම, මැදීම, සුමට කිරීමට පාවිච්චි කරනු ලබන 36, 60, 100 ඝනකමින් යුත් වැලි කඩදාසි සඳහා ලී පොළොව මට්ටම් කිරීමට ගනු ලබන යන්ත්‍රයේ පීඩන පාලනය ඒ ඒ වැලි කඩදාසි සඳහා යොදනු ලබනුයේ කෙසේ ද? යන්න. පොළොව මට්ටම් කිරීමේ දී පළමුව ලීයේ දික් මාන්ෂයේ සිට අංශක කොපමණ හැඩයකින් ද? ඒ හැඩයට යන්ත්‍රය හසුරවනු ලබන්නේ

අ.පි.බ →

දකුණේ සිට වමටද? වමේ සිට දකුණටද? යන්න සම්මත උපකරණ හා මෙවලම් භාවිතය, ලී පොළොව මත ආලේප කරනු ලබන ආලේප වල ගුණාත්මක පැවැත්ම, ආලේප කරනු ලබන වාර දෙකක් අතර වියලීමේ කාලය ගණනය කිරීම ඒ ඒ ලී සඳහා ආවේණික වර්ණයන් ආරක්ෂා වන හා නොවන ආලේප හඳුනාගැනීම, සම්මත ක්‍රම හා මූලධර්මයන්ට ඇතුළත් වනු ඇත.

විදේශ රටවල භාවිතයෙන් ඉවතලන මැෂින් බොහොමයක් ලංකාවට ගෙනැවිත් ඇත. ඒවා නැවත සකස් කිරීමේ දී පීඩනය පාලනය කිරීම ක්‍රමවත්ව නැත. එම නිසා පොළොව මට්ටම් කිරීමේ දී වැඩි ප්‍රමාණයක් ලීයේ සනකමින් ඉවත්වනු ඇත. මෙම යන්ත්‍ර සුළු පරිමානයේ ආයතනද තවත් වෘත්තිකයන් ද පරිහරණය කරනු ඇත.

ඔබගේ සේවය සිදුකරනු ලබන වෘත්තිකයා වෘත්තිය නිපුණත්වය ලබපු අයෙක්ද ? ඔහු සතුව ක්‍රමානුකූලව හැසිරවිය හැකි යන්ත්‍ර සූත්‍ර තිබේද? නැතිනම් කුලී පදනම මත ලබාගෙන සේවය සපයන්නෙක් ද? යන්න පිළිබඳ සිතිය යුතුය.

පාරිභෝගිකයා වන ඔබට නිවැරදි වෘත්තිකයෙක් හඳුනාගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු රැසක් මා විසින් හඳුන්වා දී ඇත. මව් ආයතනයේ බොහෝ කලක් සේවය කර සුවිශේෂී වෘත්තිය පන්නරයකින් හෙබි වෘත්තිකයන් කිහිප පලක් සේවාවේ යෙදී ඇත. ඔවුන් හඳුනා ගැනීම ඔබ සතුය.

පාරිභෝගිකයාවන ඔබගේ පදනම් විරහිත රුචිකත්වය අනුව වෙනස් කරනු ලබන යම් යම් ක්‍රියා නිසා මුල් කාලයේ ඉතා අලංකාර වුවද කෙටි කාලයක් තුළ අව පැහැය ලී පළුදුවීම/ ලී දිරායාම/ දේශගුණික බලපෑම්වලට ලක් වීම, ආදී අයහපත් ප්‍රතිඵල වලට මුහුණ දීමට සිදුවනු ඇත.

තවද සේවා කොන්ත්‍රාත්තුව ලබා ගන්නේ කවුරුන් ද? සේවය කරනු ලබන්නේ ඔහුද උප කොන්ත්‍රාත් කරුවෙක් ද? ගුණාත්මක සේවාවක් සිදුවන්නේ කවුරුන් විසින් ද? යන්න පිළිබඳ තීරණය කිරීම ඔබ සතුය.

මෙවැනි ලිපියකින් පාරිභෝගික ඔබව දැනුවත් කිරීමට අදහස් කරනුයේ මූල්‍යය හා වාණිජමය පැත්තට බරවී වෘත්තියේ සාම්ප්‍රදායික ක්‍රම හා සම්මත ක්‍රමවේදයන් නවීන කාර්මිකකරණයෙන් තොරව පදනම් විරහිත ක්‍රමවේදයන් මගින් පාරිභෝගික ඔබව මුලා කිරීම නවතාලීම හා වෙළඳපොල තරඟකාරිත්වයට මුහුණදිය නොහැකි වෘත්තීය නිපුණතාවයෙන් පරිපූර්ණ වූ වෘත්තිකයන්ට මෙම වෙළඳපලේ යම් ස්ථානයක් ලබාගැනීම සඳහා ය.